# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 100 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 20/01/2024<br>පැය 1140 |

## මාධ්‍ය නිවේදනය

### බොක්ෂිං තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ශ්‍රී ලංකා බොක්ෂිං සංගමය මගින් සංවිධානය කරනු ලැබූ **"96 වන ජාතික බොක්ෂිං තරඟාවලිය 2023"** 2024.01.13 දින සිට 2024.01.17 දින දක්වා කොළඹ රාජකීය විද්‍යාලයීය බොක්ෂිං කවයේදී පැවැත්විණි.

ඉහත තරඟාවලිය සඳහා බොක්ෂිං ක්‍රීඩා සමාජ 12 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 155 දෙනෙකු සහභාගි වූ අතර, ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 08 දෙනෙකු ද සහභාගි වී ඇත.

මෙහිදී, ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් තරඟ කළ ක්‍රීඩකයන් දෙදෙනෙකු සහ ක්‍රීඩිකාවක් රන් පදක්කම් 03 ක් ද, එක් ක්‍රීඩිකාවක් රිදී පදක්කමක් ද, ක්‍රීඩකයන් දෙදෙනෙකු සහ ක්‍රීඩිකාවන් දෙදෙනෙකු ලෝකඩ පදක්කම් 04 ක් ද හිමි කරගෙන ඇත. ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කල උමයංග මිහිරාන් ක්‍රීඩකයා මෙම බොක්ෂිං තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය දිනා ගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් බොක්ෂිං කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ලයනල් ගුණතිලක මහතා ද, ලේකම් ලෙස පොලිස් අධිකාරි කේ.ඒ.ඒ. කටුගම්පල මහතා ද, කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක ලක්මාල් නිශාන්ත සහ පුහුණුකරු ලෙස පොලිස් පරීක්ෂක එම්.පී. සමීර කරුණාරත්න යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.